**ශ්‍රී ලංකා පදනම - 2016**

**------------------------------**

ශ්‍රී ලංකා පදනමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් පදනමේ සභාපති වෙත 2017 ජූලි 14 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1. මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

(අ) වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනයක් සිදුකර ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම්වල ගැලපිය යුතු වුවත් ඉඩම් හා ගොඩනැගිලි හැර පිරිවැය රු.57,093,384 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.34,225,505 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පදනම විසින් පවත්වනු ලබන පාඨමාලාවල කාල සීමාව පිළිබඳ සැළකිල්ලට ගැනීමකින් තොරව පාඨමාලා ආදායම ගිණුම්ගත කිරීම හේතුවෙන් නියැදි විගණන පරීක්ෂණයට භාජනය කළ පාඨමාලා 4 ක ආදායම රු.818,250 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පදනමේ ණයගැති ශේෂය රු. 17,216,836 ක් වූ අතර ඉන් වර්ෂ 5 ට වැඩි ණය ශේෂ රු. 399,578 ක් ද, වර්ෂයක සිට වර්ෂ 5 ත් අතර ශේෂය රු. 6,262,434 ක් විය.

(ආ) පෙර දැනුම් දීමකින් තොරව සේවය හැර ගිය සේවකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු වැටුප් හා අනෙකුත් දීමනා රු. 551,863 ක් හා 3 දෙනෙකුගේ උත්සව අත්තිකාරම් ශේෂය රු.18,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 757 | 2016 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 ජුනි 15 වන දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570 හා 571 | වසර 3 ඉක්මවූ එකතුව රු.207,333 ක්වූ රඳවාගත් මුදල් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XII පරිච්ඡේදය 16.1.2 වගන්තිය | විදේශීය අධ්‍යයන කාර්යයක් සඳහා වැටුප් රහිත අඛණ්ඩ නිවාඩු ලබාදිය හැකි උපරිම කාලය වසර 3 ක් වුවත්, එක් කථිකාචාර්යවරයෙකුට අදාල වසර 03 නිමවීමෙන් පසුව තවත් වසරක කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කර තිබුණි. |
| **(ඇ) 2016 පෙබරවාරි 12 දිනැති හා අංක 2/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | |
| 05 ඡේදය | පාඨමාලා ගාස්තු අයකර ගැනීමට අපොහොසත් වීම නිසා 2013/2014 වර්ෂවලදී ආදායම ලෙස හඳුනාගෙන ණයගැතියන් යටතේ දක්වා තිබූ රු.2,617,029 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන නොසලකා පදනමේ සේවකයන් 05 දෙනෙකුට පොළිය සියයට 4.2 යටතේ ආපදා ණය වශයෙන් රු.252,780 ක සිට රු.526,560 ක් දක්වා පරාසයක ණය ලබා දී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

**මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,139,359 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.16,935,858 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,796,499 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සේවක පාරිශ්‍රමිකය රු.8,940,578 කින් හා පුහුණු කිරීම් සහ අධ්‍යාපන වියදම් රු.18,547,128 කින් අඩුවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.4,083,994 ක් වූ ඌනතාවය 2013 හා 2014 වර්ෂ තුළදී අතිරික්තයන් බවට පත්වී තිබුණි.නැවත 2015 වර්ෂයේදී රු.16,935,858 ක ඌනතාවයක් ඇති වී තිබුණද 2016 වර්ෂයේදී ඌනතාවය රු.7,139,359 ක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.85,958,365 ක් වූ දායකත්වය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර 2015 වර්ෂයේදී දායකත්වය රු.113,069,546 ක් දක්වා පහළ යාමක් නිරීක්ෂණය වුවද 2016 වර්ෂයේදී නැවතත් දායකත්වය රු.117,558,523 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

----------------

1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතේ 5 වන වගන්තිය පරිදි ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය පිළිබඳ අවබෝධය හා විශ්වාසය නගා සිටුවීම හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමද සියළු පුද්ගලයන්ගේ මූලික නිදහස පිළිපැදීමෙහිලා අන්තර් ජාතික අවබෝධය හා සහයෝගය ලබා දීම තුලින් විශ්ව ගෞරවය නගා සිටුවීමද , පොදු ජනයාට සමාජ ප්‍රගතිය පිළිබඳ අධ්‍යාපනය හා දැනීම ලබා දීමටත් ඔවුන් අතර ඒ දැනුම පතුරුවා හැරීමටත් ධෛර්යය දීම සහ ඒවා නගා සිටුවීම ප්‍රධාන අරමුණු වූ අතර එම අරමුණු සාක්ෂාත්කර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී සකස් කළ ක්‍රියාකාරි සැලැස්ම, කාර්යසාධන වාර්තා සමඟ සැසඳීමේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය හා සියලු පුද්ගලයන්ගේ මූලික නිදහස පිළිපැදීමෙහිලා අන්තර් ජාතික අවබෝධය ලබා ගැනීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සැලසුම් කළ ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) “Provide education to minimize skill gaps in line with mandate of the institution” යන ප්‍රතිපත්ති තේමාව යටතේ ආයතනය විසින් පාඨමාලා 24 ක් ආරම්භ කිරීමට සැලසුම් කළද පාඨමාලා 14 ක් ආරම්භ කර තිබූ අතර එහි ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන අංශය විසින් පිළියෙල කර තිබූ මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ අංශ 05 ක් මඟින් ඩිප්ලෝමා පාඨමාලා 11 ක් සහතිකපත්‍ර පාඨමාලා 10 ක් සහ වැඩමුළු 03 ක් පැවැත්වීමට සැලසුම්කර තිබූ නමුත්, ඩිප්ලෝමා පාඨමාලා 03 ක් සහතිකපත්‍ර පාඨමාලා 05 ක් සහ වැඩමුළු 02 ක් පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

මුද්‍රණ කටයුතු සඳහා ලබා දී ඇති රු.204,896 ක අත්තිකාරම් මුදල වර්ෂ 2 ත් වර්ෂ 9 ත් අතර කාලයක් ගත වී ඇතත් අදාල කාර්යය ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 හා 2016 අප්‍රේල් 25 දිනැති අංක 2/2016 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛවලට අනුව වැටුප් සංශෝධනය කිරීමේදී ගණකාධිකාරීවරයා සහ අභ්‍යන්තර විගණකවරිය පිළිවෙලින් මධ්‍යම මට්ටමේ කළමණාකරණ හා කනිෂ්ඨ කළමණාකරණ වැටුප් කාණ්ඩවල පිහිටුවිය යුතු වුවත්, එයට පටහැනිව 2006 වර්ෂයේ සිට ගණකාධිකාරිවරයා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරකට සහ අභ්‍යන්තර විගණක මධ්‍යම මට්ටමේ කළමණාකරණ තනතුරකට අදාළ වැටුප් කාණ්ඩවල පිහිටුවා වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඉහළ වැටුප් තලයට අදාළව ලබාගත් වැඩිපුර වැටුප් හා වරප්‍රසාදවල වටිනාකම ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2016 ඔක්තෝබර් 25 දිනැති අංක DMS/17/71/Vol/ II දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් වැටුප් කාණ්ඩ නිවැරදි කර ඇතත් ආයතනය විසින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 5 න් 3 ක්ම පුරප්පාඩුව පැවතීම ආයතනයේ පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීමේ හැකියාවක් පැවතිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1. සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාර 2016 - 2018 වර්ෂ සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මේ ආයතනයේ අරමුණු, ආයතනය සතුව වර්තමානයේ පවතින සම්පත්, සංවිධාන ව්‍යුහය සහ පෙර වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල ආදී කරුණු ඇතුළත් කොට නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ණයගැති පාලනය | ණය අයකරගැනීමට ප්‍රමාද වීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීමේ පරිපාටියක් සකස් නොකිරීම. |
| (ඇ) ආදායම් පාලනය | පාඨමාලා ආදායම නිවැරදිව ගණනය නොකිරීම හා ණය පදනම මත ශ්‍රවණාගාර හා නේවාසිකාගාර පහසුකම් සැලසීම. |